

# තාමත් අගේ වැඩි ප්‍රෙඩී.....

ආනන්ද පද්මසිරි

**(ඔක් 29 වෙනිදාට යෙදෙන ප්‍රෙඩී සිල්වා කලා කරුවාණන්ගේ 16 වෙනි අනුස්මරණය නිමිත්තෙනි.)**

දිනය 1988 පෙබරවාරි 16 වෙනිදාය.

පොල්හේන්ගොඩ නිවස ඉදිරිපටදී විජය කුමාරතුංගයන්ට වෙඩි තබා මරා දැමුවේ එදින දහවල් 12.20ටය. නොබෝ වේලාවකින් එතැනට පැමිණියේ ප්‍රෙඩී සිල්වාය. විජය මරා දමා සිටි අඹ ගස යට පස් මිටක් ප්‍රෙඩී අතට ගත්තේය. විසිරුණු ලේ බිඳු නිසා රත් පැහැ වී තිබූ එම පස් මිට රැගෙන ඔහු මෙසේ කීවේය.

"දැන් ඉතින් අපට කන්න වෙන්නේ මෙන්න මේ පස් තමයි...."

ඉතා හැඟුම්බරව හැඬුම්බර ස්වරයකින් ප්‍රෙඩී පැවසුවේ පරම සත්‍යයකි. 1987 ජූලි 07 වෙනිදා මිය ගිය එච්. ආර්. ජෝතිපාලයන්ගෙන් පසුව ඊළඟට සිනමා කර්මාන්තය රැකෙමින් තිබුණේ විජය මතය. විජය ද මරා දැමූ පසුව සිනමාවට අත්වන ඉරණම ගැන විජය මැරූ තැන සිට ප්‍රෙඩී එසේ පැවසුවේ 2001 ඔක් 29 වෙනිදා ප්‍රෙඩී සිල්වාද මියගියේ සිංහල සිනමා කර්මාන්තය දරා සිටි තුන්පාද කනප්පුවේ අවසන් පාදයද බිඳුනු වග ලොවට කියා පාමිනි.

"හල්පේ ලියනගේ මොරිස් ජෝසප් ද සිල්වා" නමින් උපන්නත් සුරතලයට කියූ " ප්‍රෙඩී" යන නම සමඟ කලා ලොවට ආ ප්‍රෙඩී සිල්වා එතෙක් මෙතෙක් සිංහල සිනමාව තුල බිහි වූ විශිෂ්ඨ විකට නළුවෙකු මෙන්ම විකට ගායකයෙකුද බව අමුතුවෙන් කිවයුතු නොවේ. "මමයි මොට්ටපාල දොට්ට දැම්ම පාසලෙන් " (සිරිල් ඒ සීලවිමල ලියූ) ඔහුගේ තැටි ගත කළ මුල්ම ගීතයයි. ඊට පෙර සාදවල ගයමින් සිටි "බාර් බාර් බාර්" ගීතය (ඇලන්සන් මෙන්දිස් ලියූ) ද ඔහු එකලම තැටි ගත කලේය. සිරිල් ඒ සීලවිමල ලියූ " පරවියා වගේ රාජමාලිගේ " ගීයද මුල් යුගයේම ජනප්‍රිය විය. මෑතදී බිහිවූ ගායකයකු ප්‍රෙඩීගේ එම ගීතය "රාජමාලිගේ පරවියා වගේ " යනුවෙන් එම වචන දෙක පමණක් මාරු කර ගයා තමන් සතු කරගැනීම ගුණමකු නව පරපුරේ ස්වභාවය කියාපාන්නකි. ඇටසැකිල්ල වාගේ, පාන් කිරිත්තා, අරොන් මාමා, අමුතු ඇඳුම්, එනකොට එනවා හිනා වෙවී, ගිනි බෝල බෝල, හඳමාමා උඩින් යතේ, කුන්ඩුමනී, එන්න එන්න වාඩිවෙන්න, තේ කූඩය, හිටියා උදාර කොල්ලෙක් ආදී වශයෙන් ප්‍රෙඩී ගේ ගීතාවලිය ද අති විශාලය. අළුත් කලාවක්, පණ පලයන් ලබන සුමාණේ, ජැක් ඇන්ඩ් ජිල්, පරණ කෝට්.... ආදී චිත්‍රපට ගීතාවලියද එසේය. විශේෂයෙන් ප්‍රේමකීර්ති ද අල්විස් සහ ප්‍රෙඩී සිල්වා සුසංයෝගය තුලින් උපහාසාත්මක විකට ගීත රාශියක් බිහිවිය.



"සුහද සොහොයුරෝ " චිත්‍රපටයෙන් සිනමා රංගනයට පිවිසි ප්‍රෙඩී පසුකාලීන්ව සිනමාවට නැතුවම බැරි නළුවෙක් බවට පත්විය. සැපත සොයො, සීතල වතුර සොයා, ඔහොම හොඳද, හත්දින්නත් තරු, සුජීවා, පාරාවළලු, සුනේත්‍රා, සූකිරි කෙල්ල, සමනල කුමරියෝ, ලසඳ, දුලීකා, කොළඹ සන්නිය, කස්තුරි සුවඳ, සිහසුන, කවුද රජා, ටොම් පචයා, නොම්මර 17, දේදුන්නෙන් සමනලියන් ඇතුලු චිතපට සිය ගණනක ඔහුගේ රංගනය ඇතුළත් විය.

තමාම නිශ්පාදනය කළ "ඔක්කොම හොඳටයි" චිත්‍රපටයේ දිල්හානි අශෝක මාලා සමඟ පෙම්වතා ලෙස රඟ පෑ ඔහු එහිදී "රෑං රෑං බමරා මල් රොන් පාරේ ආවා" පෙම් ගීතය ලතා වල්පොල සමඟ ගැයුවේය.

ගාමිණී ෆොන්සේකා, විජය කුමාරතුංග, තිස්ස විජේසුරේන්ද්‍ර ඇතුළු සියලුම මුල්පෙලේ නළුවන් සමඟ කරට කර රඟපෑ විකට නළුවා ප්‍රෙඩීය. ඔහුගේ චිත්‍රපට යුග ගීත අතර මාමේ මේ බකමූණා (ජෝති සමඟ) යකඩ කටේ දොර ඇරිලා (ඇන්ජලින් සමඟ) පාට සරුංගල් වාගේ (විජය සමඟ) ගහකොළ මල් (ජෝති සමඟ) චිං චිං නෝන චිං (ජෝති / මිල්ටන් පෙරේරා සමඟ) යන ගීතද කැපී පෙනෙයි. ජනප්‍රියම නළුවා ලෙස සම්මානය හිමිකරගත් එකම විකට නළුවා ප්‍රෙඩීය.

ප්‍රෙඩී සිල්වා නම් කලා කරුවා ගැන කිවයුත්තේද ඔහු වැන්නවුන් යලි බිහි නොවන බවය. :ධබැ'බා ධබකහ* කර්මාන්තයක් ලෙස සිනමාව ජීවත් කල ප්‍රෙඩීට සිනමාව කළගුණ නොසැලකුවත් රසික ජනතාවට නම් අදටත් අගේ වැඩි විකට නළු ගායකයා ප්‍රෙඩී සිල්වාය.

